ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**ඉන්දීය මහ කොමසාරිස්තුමා රංගිරි දඹුලු විහාරයේ සංචාරයක නිරත වේ (2026 ජූනි 04)**

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා 2026 ජූනි 04 වන දින ඓතිහාසික රංගිරි දඹුලු විහාරයේ සංචාරයක නිරත විය. සංචාරය අතරතුරදී මහ කොමසාරිස්තුමා විහාරාධිපති අති පූජ්‍ය ආචාර්ය ගෝඩගම ධර්මකීර්ති ශ්‍රී චන්ද්‍රානන්ද මංගලාභිධාන හිමිපාණන් වහන්සේ සහ අස්ගිරි නිකායේ ජ්‍යෙෂ්ඨ කාරක සභා සාමාජිකයන් හමු විය.

2. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික සහ ප්‍රජා සංවර්ධන මුලපිරීම් උදෙසා ඉන්දියාව විසින් ලබා දෙන අඛණ්ඩ සහයෝගයේ කොටසක් ලෙස මහ කොමසාරිස්තුමා ශ්‍රී වළගම්බා පිරිවෙනේ තරුණ හිමිවරුන් සහ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, මේස, පුටු සහ වෙනත් අධ්‍යාපනික උපකරණ භාර දුන්නේය.

3. පොදු උරුමය ආරක්ෂා කරගැනීම සඳහා ඉන්දියාවේ පුළුල් කැපවීම අවධාරණය කළ මහ කොමසාරිස්තුමා ඉන්දියාව අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ දැක්ම යටතේ දෙරට අතර බෞද්ධ සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 15ක විශේෂ ප්‍රදානයක් නිවේදනය කර ඇති බව ප්‍රකාශ කළේය. දිවයින පුරා බෞද්ධ විහාර සහ පිරිවෙන් 9,000කට පමණ නොමිලේ විදුලිබලය ලබා දීම මෙම ප්‍රදානය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහනකි.

4. රංගිරි දඹුලු විහාරය වැඳ පුදා ගත් මහ කොමසාරිස්තුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සාමය, සෞභාග්‍යය සහ දිගුකාලීන මිත්‍රත්වය සහ සමීප සබඳතා වර්ධනය වේවායි ප්‍රාර්ථනා කළේය. ජනතාව අතර සබඳතා ශක්තිමත් කිරීම සඳහා ඉන්දියාවේ කැපවීම අවධාරණය කරමින් මහ කොමසාරිස්තුමා පොදු අධ්‍යාත්මික වටිනාකම් සහ බෞද්ධ උරුමය ශිෂ්ටාචාරමය නිවුන් සහෝදරයන් බඳු දෙරට අතර සබඳතාහි හදවත වැනි යැයි ද ඒවා දෙරටට සෞභාග්‍යමත් සහ වඩා සමීප ද්විපාර්ශ්වික සහයෝගීතාවයක් සහිත අනාගතයකට මඟ පෙන්වන බව ද පැවසීය.

***

**කොළඹ**
***2026* ජූනි *08***